// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 1775/20 – 2012 සැප්තැම්බර් 14 වැනි සිකුරාදා – 2012.09.14

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## III වැනි කොටස – ඉඩම්

### ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

යොමු අංකය: RAT/LAN/09/F1/77.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබාගැනීමට රජය අදහස් කරන බැවි, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර:

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, රත්මලාන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, දෙහිවල ගල්කිස්ස මහ නගර සභා සීමාවේ කඳවල ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කර ඇති අංක 521001/06/01 හා 2012.01.17 දිනැති කැඩැස්තර සිතියමේ කැබලි අංක 23 වශයෙන් පෙන්නුම් කර ඇති ප්‍රමාණයෙන් හෙක්. 0.1953 ක් වූ ඉඩම් කැබැල්ල:

කැබලි අංක 23

ඉඩමේ නම: කඳවලවත්ත; විස්තරය: වරි. අංක 76, කඳවලවත්ත, කඳවල පාර, රත්මලාන; මුල් හිමිකම් කියන අය: ඩා වින්සි බී. එස්. ඩී. ඉංජිනියරින්, කන්ස්ට්‍රක්ෂන් සහ ඉන්වෙස්ට්මන්ට් (පෞද්.) සමාගම, නො. 39, ශාන්ත මයිකල් පාර, කොළඹ 03; ප්‍රමාණය: හෙක් 0.1953.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 2012 නොවැම්බර් මස 15 වැනි දින පෙ.ව. 10.30 ට රත්මලාන, ගාලු පාරේ, අංක 175 දරන ස්ථානයේ පිහිටි ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුය.

තවද, 2012 නොවැම්බර් මස 08 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

ප්‍රදීප් රත්නායක,
ප්‍රාදේශීය ලේකම්,
රත්මලාන.

2012 සැප්තැම්බර් මස 11 වැනි දින,
රත්මලාන ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

09 – 1114

1A – G 16592 – 350 (2012/09) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.